ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා අධ්‍යයන පීඨය
නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව
නීතිවේදී උපාධි පාඨමාලාව - **5** මට්ටම
අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය **I - 2022/2023**

**LLU5810 -** ඉඩම් නීතිය

කාලය - පැය **1**

---

දිනය: **2023** සැප්තැම්බර් **22** වේලාව: ප.ව.**03.30** – ප.ව. **04.30**

---

**එක් (01) ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.**
**අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.**

---

1. 'හිමිකරුවෙකුගේ අයිතිවාසිකම් ශීර්ෂ තුනක් යටතේ සමන්විත වේ. ඒවා නම්, (අ) භුක්ති විඳීමේ අයිතිය සහ භුක්තිය ආපසු ලබාගැනීමේ අයිතිය; (ආ) භාවිත කිරීමේ සහ ඵල ප්‍රයෝජන ලබා ගැනීමේ අයිතිය; සහ (ඇ) බැහැර කිරීමේ අයිතිය වේ.'

   Sir AFS Massdorp, *The Institutes of Cape Law* (JC Juta & Company, 1907).

   ඉහත ප්‍රකාශය අනුව ශ්‍රී ලංකාව තුළ හිමිකාරිත්වය සීමා කරන ව්‍යවස්ථාපිත විධිවිධාන විශ්ලේෂණය කරන්න.

   අදාළ නෛතික අධිකාරි ඇසුරෙන් ඔබේ පිළිතුරට සහය දක්වන්න.

   **(ලකුණු 20)**

2. රමයා කොළඹ ප්‍රදේශයෙන් විශාල ගෙවත්තක් සහිත ආකර්ෂණීය නිවසක් කුලියට ගත්තාය. කුලියට ගත් නිවසේ රැඳී සිටි කාලය තුළ, රමයා එම ගෙවත්තේ වෙනස්කම් කිහිපයක් සිදුකළාය. එනම්,

   අ) ගෑස් උදුනක් සහිත එළිමහන් මුළුතැන්ගෙයක්.

   ආ) උද්‍යාන මණ්ඩපයේ පොළොවට සම්බන්ධ කරන ලද සාම්ප්‍රදායික ලී ඔන්චිල්ලාවක්.

   ඇ) ආලින්දයේ ලී කණුවලට සවි කරන ලද අලංකාරවත් පහන් කූඩු.

   ඉ) ප්ලාස්ටික් පෝච්චිවල රෝපණය කරන ලද විවිධ වර්ගයේ අලංකාර මල්.

   එම නිවසේ කුලිය අවසන් කර රමයා ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වීමට අදහස් කරයි. කෙසේවෙතත්, ගෙවත්තේ කුමන වෙනස් කිරීම් දේපළ සමඟ පැවතිය යුතුද යන්න පිළිබඳව ඇය අවිනිශ්චිත අදහසක සිටී.

   රමයාට උපදෙස් දෙන්න.

   අදාළ නඩු තීන්දු ඇසුරෙන් ඔබේ පිළිතුරට සහය දක්වන්න.

   **(ලකුණු 20)**

***හිමිකම් ඇවිරිණි.***